# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි තෙවන වසර පරීක්ෂණය (බාහිර)- 2022

2025 - මාර්තු

## BCOME 3045 - ජාත්‍යන්තර ආර්ථක විද්‍යාව

ප්‍රශ්න සංඛ්‍යාව : (හතයි ) 07 කාලය : පැය 03 යි

ඕනෑම ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

---

### ප්‍රශ්න අංක - 01

ඇ. රටවල් ජත්‍යන්තර වෙළඳාමට අවතීර්ණ වන්නේ ඇයි ?

(ලකුණු 06)

ආ. " සම්පත් බෙදීමේ අකාර්යක්ෂමතාවය " ජාත්‍යන්තර වෙළඳාමේ වර්ධනයට අහිතකර ලෙස බලපාන බව තහවුරු කිරීම සඳහා කරුණු හතරක් ගෙනහැර දක්වන්න.

(ලකුණු 07)

ඇ. " ව්‍යවසායකත්වයේ නිදහස " සහ " තේරීමේ නිදහස " ජාත්‍යන්තර වෙළඳාමේ උන්නතියට බලපාන්නේ කෙසේද ?

(ලකුණු 07)

(මුළු ලකුණු 20)

### ප්‍රශ්න අංක - 02

අ. "වෙළඳ අනුපාතය" නිර්වචනය කර වෙළඳ අනුපාතය තීරණය කරන සාධක මොනවාද පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ආ. " වෙළඳ අනුපාතය ඉහළයාමට " හෝ " පහළයාමට " බලපාන සාධක විස්තර කරන්න.

(ලකුණු 06)

ඇ. ශ්‍රී ලංකාව වැනි ආර්ථික ගැටළු මුහුණ දෙන රටවල ආර්ථික ස්ථායිත්වය ලබාගැනීමට භාණ්ඩ හා සේවා ආනයනය කළයුතු අකාරය විස්තර කරන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 20)

ප්‍රශ්න අංක - 03

අ. නිදහස් ව්‍යවසාය ආර්ථික ක්‍රමයක් තුල ජාත්‍යන්තර වෙළඳාමේ වර්ධනයක් ඇතිකළ හැකිද පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ආ. " බාටර් ක්‍රමය " ජාත්‍යන්තර වෙළඳපල තුළ ප්‍රචලිත නොවූයේ ඇයි ? පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ඇ. වෙළඳපොල ආර්ථිකයක ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් ආර්ථික පද්ධතියක දක්නට ලැබෙන මූලික ආයතනික ලක්‍ෂණ ජාත්‍යන්තර ආර්ථිකයට සම්බන්ධ වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 10)
(මුළු ලකුණු 20)

ප්‍රශ්න අංක - 04

අ. ශ්‍රී ලංකාවේ වරණීය වෙළඳාමේ කැපී පෙනෙන අංගයක් ලෙසින් " ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම " වැදගත් වන්නේ ඇයි ?

(ලකුණු 04)

ආ. ශ්‍රී ලංකාව වරණීය වෙළඳ ගිවිසුම්වලට අවතීර්ණ වූයේ ඇයිදැයි හේතු පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ඇ. දකුණු ආසියාතික නිදහස් වෙළඳ ගිවිසුම ශ්‍රී ලංකාවේ වෙළඳාම පුළුල් කිරීම සඳහා කෙසේ බලපෑවේද ?

(ලකුණු 08)
(මුළු ලකුණු 20)

ප්‍රශ්න අංක - 05

අ. " ප්‍රපාතනය " වැළැක්වීමට රජයට ගත හැකි ක්‍රියාමාර්ග කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ආ. තීරු බදු නොවන වෙළඳබාධක හතක් (07) ක් නම් කොට ඒවා කෙටියෙන් පහදන්න.

(ලකුණු 14)
(මුළු ලකුණු 20)

ප්‍රශ්න අංක - 06

අ. ලෝක වෙළඳ සංවිධානය පිහිටුවීමේ ප්‍රධාන අරමුණු සහ එහි ප්‍රධාන කාර්යයන් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ආ. පහත සඳහන් ඒවායින් ඕනෑම දෙකක් උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

i. තීරු බදු සංගම් (Custom Unions)
ii. පොදු වෙළඳපොලවල් (Common Markets)
iii. ආර්ථික හවුල් (Economic Unions)

(ලකුණු 6x2 = 12)

(මුළු ලකුණු 20)

ප්‍රශ්න අංක - 07

අ. පහත සඳහන් ජාත්‍යන්තර වෙළඳ න්‍යායන් ජාත්‍යන්තර වෙළඳාමේ වර්ධනයට බලපෑවේ කෙසේදැයි පැහැදිලි කරන්න.

i. වාණිජවාදීන්ගේ අදහස්

ii. නිරපේක්ෂ වාසි න්‍යාය

(ලකුණු 5X2 =10)

ආ. " සාපේක්ෂවාසි න්‍යාය " පදනම් වූ උපකල්පන පැහැදිලි කර සාපේක්ෂ වාසි න්‍යාය නූතන වෙළඳ න්‍යායන්ට පදනමක් වූයේ ඇයි දැයි කෙටියෙන් විමසන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

---